## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ගෘහපාලන සහායක තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ ගෘහපාලන සහායක තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2018 අගෝස්තු මස 09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "ගෘහපාලන සහායක තනතුර"යනුවෙන් සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

1. *වැටුප් පරිමාණය* :- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9 x 270/10 x 300/6 x 330-රු. 32,930 /- වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 20,248 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දළ මාසික වැටුප රු. 50,000.00 පමණ වේ).

   "ගෘහපාලන සහායක" තනතුරේ අවුරුදු10 ක සතුටුදායක සේවයකින් පසු "ජ්‍යෙෂ්ඨ ගෘහපාලන සහායක" තනතුරට උසස් කරනු ලැබේ.

2. *වයස් සීමාව* :- 2018 අගෝස්තු මස 9 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

3. *අධ්‍යාපන සුදුසුකම්*:- සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම්*:- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) හෝ ඒ හා සමාන වෘත්තීය පුහුණු ආයතනයක, හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ මාස 05කට නොඅඩු වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා එය සාර්ථකව නිමකොට තිබීම.

5. *පළපුරුද්ද* :- හෝටල් ක්ෂේත්‍රයේ ගෘහ පාලන සහායක හෝ ඒ හා සමාන තනතුරක මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය* :- ලිඛිත/ වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

7. *සේවා නියමයන් හා කොන්දේසි*:-

   (i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

   (ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

   (iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

   (iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

   (v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

   (අ) උප්පැන්න සහතිකය,
   (ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

9. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

10. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

2018 ජූලි මස 13 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

*ගෘහපාලන සහායක තනතුර සඳහා ආදර්ශ අයදුම්පත*

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs./Miss.) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (අ) පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය :————.
(ආ) කාර්යාලයීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කල යුතු ලිපිනය :

පෞද්ගලික [ ] කාර්යාලයීය [ ]

04. (i) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ii) 2018 අගෝස්තු මස 09 වැනි දිනට වයස :-අවුරුදු :————. මාස :————. දින :————.

05. විවාහක/ අවිවාහක බව :————.

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :————.

08. අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

| *විභාගය* | *විෂයයන්* | *සාමාර්ථයන්* | *වර්ෂය* |
|---|---|---|---|
| අ. පො. ස. (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය.)
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

10. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

..........................................................................................
..........................................................................................

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) දැනට දරන තනතුර :————.
(ඇ) මුල් පත්වීමේ දිනය :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද?
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

---

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල
සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................තනතුර දරන,........................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

07-974/2